# සාධාරණයක් වෙයිද කියල බලා ඉන්නවා

මගේ වාහනයට පහර දීල, කඩා දමල මාස තුනකටත් වැඩියි. මාව දේශද්‍රෝහියෙක් කියල හංවඩු ගහල, මේ දේවල් කළේ මහින්ද රජය විසින්මයි.

ඉතාම සංවිධානාත්මකව තමයි මේ වැඩය කළේ. එදා ඒවා කරපු උදවිය කවුද කියල අපි හොඳට දන්නවා. මේ විස්තර අපි කටඋත්තර මගින් ගුවන් තොටුපල පොලීසියටත්, ඉන්පසුව කඳාන පොලීසියටත් දන්වලයි තියෙන්නේ.

අපේ පැත්තෙන් හත් දෙනෙක් කටඋත්තර දීල කරුණුකාරණා තහවුරු කරල තියෙන්නේ. පොලීසියම පිළිඅරන් තියෙනව මෙය පිරිසක් විසින් හිතාමතා කළ පහර දීමක් කියල. ඒත් ඒ ගැන හරියාකාර සොයාබැලීමක් කරල තිබුනේ නෑ.

ඒ නිසා තමා පහුගිය සතියේ මාර්තු විසි හතර වැනිදා අපි පාගමනින් ගිහින් පොලීසියේ ප්‍රධාන කාර්යාලයේදී පොලිස්පතිතුමා හමු වෙලා කරුණු දැක්වූයේ.

මේ වැඩපිළිවෙල සකස් කළේ එදා සිද්ධිය ගැන එකතු වුණ අය ගොඩනගපු ප්‍රජාතන්ත්‍රවාදී එකමුතුව මගින්. එදාම අපට වුණ දේ ගැන අහපු උදවිය සෑහෙන පිරිසක් අපට උදව්වලට ආවා.

විවිධ දේශපාලන පක්ෂවල අය, නීතිඥමහත්වරු, සමාජ සංවිධානවලට බැඳිල වැඩ කරන අය, වෘත්තීය සමිති ක්‍රියාකාරීන්, පූජක උන්නාන්සේලා ආදී වශයෙනුත් එදා ඉඳල කට්ටිය සහභාගී වුණා.

නන්ද සාදුත් තව සාදුලා කිහිප දෙනෙක් එදා ආවා වුණත් උන්වහන්සේලාට දිගටම හවුල් වෙන්න බැරි වුණා. ඒත් ඒ හාමුදුරුවන් අප සමඟ ඉන්නව කියලයි දන්වලා තියෙන්නේ.

මේ විදියට විවිධ සමාජ තලවල අය මේ පොදු ප්‍රශ්නය වෙනුවෙන් එකතු වුණා. ඒ අය කවුරුත් කිව්වේ "බාහු එංගලන්තයේ ගිහින් කළ කථා මොනව වුණත්, එයාට අදහස් දැක්වීමට නිදහස තියෙන්නේ ඕනෑ" කියලයි.

අපට පහර දීපු මැරයෝ කිව්වේ, මන් එංගලන්තයට ගිහින් කරපු ප්‍රචාර නිසා දෙමළ ජනතාව ඇවිස්සිලා මහින්දට එංගලන්තයට ගොඩවෙන්න ඉඩ දුන්නේ නැහැ කියලයි.

ඇත්තටම කිසි සැලසුමක් නැතිව එංගලන්තයට මහින්දව පටවල ඇරපු මිනිස්සුන්ට නම් යම් ගැලවිජ්ජාවක් උවමනා වෙලා තියෙනවා. ඒ අනුව "වික්‍රමබාහු තමයි මහින්දට කරදර කළේ" කියන සූත්තරය ඔවුන් හදාගෙන ආණ්ඩුවට ලනුව දුන්නා.

ඇත්තටම මහින්දට පහර දෙන්න මන් කථා කරන්න වැඩක් නෑ. දෙමළු කොහොමටත් කිපිල ඉන්නේ මහින්දගේ යුදවාදයට විරුද්ධව. ඒ නිසා ආරක්ෂාවක් නැතිව ලන්ඩන් ආපු මහින්දට විරුද්ධව සෑහෙන පිරිසක් එකතු වුණ එක ඇත්ත.

ඒකට මගේ මැදිහත්වීම කොයි තරම් බලපෑවද කියල කවුද දන්නේ. ඒ වුණත් වැඩේ වැරදුනහම කාගේ හරි පිටින් අරින එක සිරිතක්නේ.

කොහොම වුණත් අපට සහයෝගයට එකතු වුණ අය දිගින් දිගටම කථා කළේ මේ රටේ ඇති වී තිබෙන ප්‍රජාතන්ත්‍රවාදයේ බිඳ වැටීම ගැනයි. ඒ අතර අපරාධකාරයින් හඳුනාගෙනත් ඒ ගැන පොලීසිය ක්‍රියා නොකිරීම ලොකු ප්‍රශ්නයක් හැටියට හැමෝම කල්පනා කළා.

ඒ නිසා තමා අපට වෙච්ච දේ ගැන දිගටම ක්‍රියාකාරී බලපෑම් ගෙන යාමට මේ අයගේ සභාව තීන්දු කළේ. පසුගිය මාසයේ තිබ්බ මහා සභා වාරයේදී මේ ඇත්තෝ තීන්දු කළා මේ පහර දීම ගැන පොලීසිය කටයුතු නොකිරීම ගැන පෙත්සමක් පොලීස්පතිතුමාට ඉදිරිපත් කරන්නට.

මේකට මුලික වුණේ සත්තිවේල් පියතුමා, නීතිඥචන්ද්‍රපාල කුමාරගේ, නීතිඥඑස්.ජී. පුංචිහේවා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.කේ. සිවාජිලිංගම්, වී. තිරුණාවුකරසු, කාන්තා ක්‍රියාකාරිනී සන්ධ්‍යා එක්නැළිගොඩ, මහින්ද දේවගේ, ප්‍රේමපාල හේවාබටගේ, අජිත් රූපසිංහ, ධර්මසිරි ලංකාපේලි සමඟ ලීනස් ජයතිලකයි. අන්තර්ජාලයට පෙත්සම ඇතුල් කරන්නත් මේ ඇත්තෝ ක්‍රියා කළා.

මේ පෙත්සමේ මෙහෙම තියෙනවා.

"1. බණ්ඩාරනායක ගුවන් තොටුපලේදී නව සම සමාජ පක්ෂයේ ප්‍රධාන ලේකම් ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්නට පහර දීමට තැත් කිරීම මෙන්ම ඔහුගේ හිතවතුන්ට පහර දීම ගැන පොලීසියට පැමිණිලි කර තිබේ.
2. 7/12/10 දිනයේදී එංගලන්තයේ සිට පැමිණි ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්නට ගුවන් තොටුපලේ පැමිණීමේ පර්යන්තයේදී පහර දීම මෙහෙයුම් කළේ ආණ්ඩුවේ ඇමති කෙනෙකුගේ පුතෙක් සමඟ ටැක්සි කවුන්ටරයේ ක්‍රියාකාරීන් දෙදෙනෙක් විසිනි.
3. මෙතැනදී වික්‍රමබාහුගේ හිතවතුන් ඔහු බේරාගෙන වෙනත් වාහනයකින් ඉක්මණින් පිටත් කර ඇත.
4. ඔහුගේ සහයට පැමිණි වී. තිරුණාවුක්කරසු, හා ශාන්ත විජේසූරිය යන දෙදෙනා ගමන් කළ 253/7286 වාහනය කඳාන නගරය අසල දී බලෙන් නවතා, පහර දී, තදබල ලෙස හානියට පත් කර ඇත. වාහනය පිටුපස හඹාගෙන විත් පහර දී ඇත.
5. මේ පිළිබඳව ගුවන්තොටුපල පොලීසියට, කොම්පඤ්ඤවීදිය පොලීසියට හා කඳාන පොලීසියට පැමිණිලි කර දී ඇත."

24 වැනිදා කොළඹ කොටුව දුම්රියපොල අසලට සෑහෙන පිරිසක් එකතු වෙලා හිටියා. මන් හිතන්නේ සියයකට ආසන්න පිරිසක් එතැනට ඇවිත් හිටියා. එත් විශාල පොලිස් හමුදා මෙහෙයුමක් දියත් කරල තිබුණා.

DIG, SSP මට්ටමේ පොලිස් නිලධාරීන් පිරිසක් මෙහෙයුම භාරව හිටිය. ඒ අය අපට ඇවිත් කිව්වේ පාර දිගේ ඇවිදගෙන යන්න එපා කියන එකයි. පොලිස් වාහනවලින්ම IGP කාර්යාලය ළඟට ගෙනියන්නත් පොරොන්දු වුණා. අපේ ආරක්ෂාවට වගේ තමා කථා කළේ.

ඒත් අපි කිව්වා අපට පාරේ ඇවිද ගෙන යන්න අයිතියක් තියෙනවා කියල. අන්තිමේදී ඒ අය එකඟ වුණා. එතැනට ඇවිත් හිටියා ශක්තිවේල් පියතුමා, මහින්ද දේවගේ, එස්.ජී. පුංචිහේවා, සන්ධ්‍යා එකැනිළිගොඩ, ආදි නායකයින් පිරිසක්.

අපි ඇවිදගෙන IGP කාර්යාලයට ගියත් ඇතුළට ගියේ පස්දෙනයි. මා සමඟ පියතුමා, එස්ජී, ශ්‍රීනාත් පෙරේරා හා සන්ධ්‍යා පමණයි. අපව හොඳින් පිළිඅරන් සාකච්චාවක් කළා.

අපි ආචාර්ය මහින්ද බාලසූරිය පොලිස්පතිතුමාට පෙත්සම පිළිගන්වලා පැහැදිලි කළා අපට විණ කළ අය හඳුනාගෙන තිබෙද්දීත් කිසිම පියවරක් නොගැනීම ගැන. උන්නැහේ විස්තර වාර්ථා කැඳවල, විමසල බලල, පිළිගත්ත අඩුපාඩුවක් වෙලා තියෙනවා කියල.

ඒ අනුව මේ සිද්ධියේ විමර්ශනය ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඉවත් කරල විශේෂ විමසුම් ඒකකයේ එරික් පෙරේරා ජොෂ්ඨ පොලිස් අධිකාරීතුමාට එය බාර කළා. අපට එතුමා සමඟ ඒ ගැන කථාබහ කරල සම්බන්ධය පවත්වාගෙන යන්න කියලත් කිව්වා.

ඒ අනුව අපි එරික් පෙරේරා මහත්තයත් එක්කත් කථාබහ කරල එළියට ආවා. පොලීසිය ඇතුලේදි මගපෙන්නුවේ මැකාති පෙරේරා අධිකාරීතුමයි. අපි බලා ඉන්නවා යුක්තියක්, සාධාරණයක් වෙයිද කියල.